බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

2017 ජූලි මස 04 වන දින පෙ.ව. 9.30 ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

1. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන, ස වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධ පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2017.06.20 දින අසන ලද ප්‍රශ්නය; (ප්‍ර/vi(1)/17/56)

---

(අ) කොළඹ දිස්ත්‍රික්කය තුළ පෞද්ගලික බස් ධාවනයට අදාලව පාරවල් සඳහා අලුතෙ බස් රථ යෙදවීමට අවස්ථා කීයකදී ටෙන්ඩර් කැඳවන ලද්දේද?

(ආ) ඒ කුමන ධාවන අංක සහිත පාරවල් සඳහාද? එකී ටෙන්ඩරයන්ට අනුව ඉදිරිපත් ඇති පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම් සහ මිල ගණන් වෙන් වෙන්ව සඳහ කරන්නේද?

(ඇ) එම ටෙන්ඩර් වලංගු වන්නේ වසර කීයක් සඳහාද?

(ඈ) එම ටෙන්ඩර් මණ්ඩලවල සාමාජිකයන්ගේ නම් හා තනතුරු මොනවාද?

(ඉ) බස් රථ ප්‍රමාණය අතිරික්තවීම හේතුවෙන් දිනකට ඇතැම් බස් රථ ධාවනයෙ ඉවත්කර තිබේද?

(ඊ) අතිරික්ත බස් තිබෙන පාරවල් සඳහා නැවත ටෙන්ඩර් කැඳවා බස්රථ යෙදවී නීත්‍යානුකූලද?

(උ) පාරවල් සඳහා බස්රථ ඇතුලත් කිරීමට අධිකරණ නියෝගයකින් යම් ප්‍රමිතිය හඳුන්වා දී ඇත්තේද?

(ඌ) මෙම ටෙන්ඩර් කැඳවීම් වලදී අතයට ගණුදෙනු සිදුවී ඇත්තේද?

(එ) මෙලෙස ටෙන්ඩර් කැඳවූ බස් රථ මේ වන විට ධාවනයේ යෙදෙන්නේද?

(ඒ) නොඑසේ නම් ඒ මන්ද?

2. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන, හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2017.06.20 දින අසන ලද ප්‍රශ්ණය; (ප්‍ර/vi(1)/17/57)

(අ) කළුතර දිස්ත්‍රික්කය තුළ පෞද්ගලික බස් ධාවනයට අදාලව පාරවල් සඳහා අලුතෙන් බස් රථ යෙදවීමට අවස්ථා කීයකදී ටෙන්ඩර් කැඳවන ලද්දේද?

(ආ) ඒ කුමන ධාවන අංක සහිත පාරවල් සඳහාද? එකී ටෙන්ඩරයන්ට අනුව ඉදිරිපත් වී ඇති පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම් සහ මිල ගණන් වෙන් වෙන්ව සඳහන් කරන්නේද?

(ඇ) එම ටෙන්ඩර් වලංගු වන්නේ වසර කීයක් සඳහාද?

(ඈ) එම ටෙන්ඩර් මණ්ඩලවල සාමාජිකයන්ගේ නම් හා තනතුරු මොනවාද?

(ඉ) බස් රථ ප්‍රමාණය අතිරික්තවීම හේතුවෙන් දිනකට ඇතැම් බස් රථ ධාවනයෙන් ඉවත්කර තිබේද?

(ඊ) අතිරික්ත බස් තිබෙන පාරවල් සඳහා නැවත ටෙන්ඩර් කැඳවා බස්රථ යෙදවීම නීත්‍යානුකූලද?

(උ) පාරවල් සඳහා බස්රථ ඇතුලත් කිරීමට අධිකරණ නියෝගයකින් යම් ප්‍රමිතියක් හඳුන්වා දී ඇත්තේද?

(ඌ) මෙම ටෙන්ඩර් කැඳවීම් වලදී අකයට ගණුදෙනු සිදුවී ඇත්තේද?

(එ) මෙලෙස ටෙන්ඩර් කැඳවූ බස් රථ මේ වන විට ධාවනයේ යෙදෙන්නේද?

(ඒ) නොඑසේ නම් ඒ මන්ද?

3. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන, හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2017.06.20 දින අසන ලද ප්‍රශ්ණය, (ප්‍ර/vi(1)/17/58)

(අ) ප්‍රවාහන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ තනතුරු කීයක් පුරප්පාඩු වී ඇත්තේද?

(ආ) ඒ කවදා සිටද?

(ඇ) ඒ සඳහා වැඩ බැලීමට පත් කරන ලද පුද්ගලයන්ගේ නම් සහ තනතුරු මොනවාද?

(ඈ) එම වැඩ බැලීම් වෙනුවෙන් එක් එක් පුද්ගලයා වෙත අතිරේකව ගෙවනු ලබන දීමනා වෙන් වෙන්ව සඳහන් කරන්නේද?

(ඉ) මෙම පුරප්පාඩු පිරවීමකින් තොරව පුද්ගලයන් වැඩ බැලීමට යොදවා අතිරේක දීමනා ගෙවන්නේ පෞද්ගලික හිතවත්කම් මතද?

(ඊ) මෙම වැඩ බැලීම සිදු කිරීම නවත්වා එකී තනතුරු වලට ආයතනය තුළ සිටින සුදුස්සන් හෝ පිටතින් පුද්ගලයින් බඳවා නොගන්නේ මන්ද?

(උ) තනතුරු දෙකක වැඩ කිරීමේ දී කාර්යයගුරුව එකී කාර්යයන් ඉටු කිරීම අපහසු වන බවත්, එමඟින් මහජනයාට විධිමත් සේවාවන් සැපයීමක් කළ නොහැකි බවත් ඔබතුමා පිළිගන්නේද?

(ඌ) අමාත්‍යාංශයේ සම්පූර්ණ වැඩ බැලීම් තනතුරු සඳහා දීමනා ගෙවීමට මාසිකව අතිරේකව වැය කරන සම්පූර්ණ මුදල කොපමණද?

(එ) පාඩු ලබමින් සහ රජයෙන් දීමනා ලබමින් ධාවනය වන ශ්‍රී ලංගම සේවාවන්ට වඩා වැඩි බස් රථ ප්‍රමාණයක් තමන්ගේම වියදමින් සියලු කටයුතු සිදු කර ගෙන රජයටද ආදායමක් ලබා දී ධාවනයේ යෙදෙන පෞද්ගලික බස්රථ ධාවකයන්ට වඩා යහපත් සේවාවක් ලබා දීමට හැකි වන ලෙස ඔබ අමාත්‍යාංශයේ පවතින දුර්වලතා / අඩුපාඩු නිවැරදි කිරීමට ඔබතුමා පියවර ගන්නේද?

(ඒ) නොඑසේ නම් ඒ මන්ද?

4. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2017.06.20 දින අසන ලද ප්‍රශ්නය, ( ප්‍ර/vi(1)/17/59)

(අ) 2015 සිට 2017 ජුනි 06 දක්වා කැස්බෑව නගර සභාව විසින් කරන ලද මාර්
සංවර්ධන ව්‍යාපෘති ගණන කීයද?

(ආ) එම සියලු මාර්ග සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධව,

I. ව්‍යාපෘතියේ නම ,
II. ප්‍රතිපාදන මූලාශ්‍රය,
III. ඇස්තමේන්තු මුදල,
IV. ව්‍යාපෘතිය ප්‍රදානය කළේ ටෙන්ඩර් මඟින්ද වෙනත් ක්‍රමයක් මඟින්ද යන
V. අවසාන වශයෙන් කොන්ත්‍රාත්තුව තීරණය වූ මුදල,
VI. ව්‍යාපෘතිය කළ අයගේ නම හා ලිපිනය ,
VII. වැඩ පටන් ගත් දිනය,
VIII. වැඩ අවසන් කළ දිනය,
IX. ගෙවීම් කර අවසන් නම් එම දිනය,

යන තොරතුරු ඇතුලත් වාර්තාවක් ඉදිරිපත් කරන්නේද?

(ඇ) මහජන නියෝජිත පාලනයක් නැති තත්වයක් තුල නගර සභාවේ ප්‍රතිපාදන යොදව
කරන ව්‍යාපෘති කවරේද යන්න තීරණය කරන්නේ කවුරුන්ද?

(ඇ) සංවර්ධනය නොකල එහෙත් සංවර්ධනය කළ යුතු මාර්ග ඇති බව ඔබතුමා දන්නේද?

(ඉ) ප්‍රමුඛතාවය අනුව හඳුනාගත් මාර්ග සංවර්ධනයට වැඩපිළිවෙලක් තිබේද?

(ඊ) ඉදිරියේ සංවර්ධනය කළයුතු මාර්ග පිළිබඳ ප්‍රමුඛතාවය අනුව නම් කළ හැකිද?

(උ) ඒ අනුව මාර්ග පිළිබඳව ලේඛනයක් ඉදිරිපත් කරන්නේද?

(ඌ) නොඑසේ නම් ඒ මන්ද?

5. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2017.06.20 දින අසන ලද ප්‍රශ්ණය, ( ප්‍ර/vi(1)/17/60)

(අ) 2015 සිට 2017 ජූනි 06 දක්වා බොරලැස්ගමුව නගර සභාව විසින් කරන ලද මාර්ග සංවර්ධන ව්‍යාපෘති ගණන කීයද?

(ආ) එම සියලු මාර්ග සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධව,

I. ව්‍යාපෘතියේ නම ,
II. ප්‍රතිපාදන මූලාශ්‍රය,
III. ඇස්තමේන්තු මුදල ,
IV. ව්‍යාපෘතිය ප්‍රදානය කළේ ටෙන්ඩර් මඟින්ද වෙනත් ක්‍රමයක් මඟින්ද යන වග ,
V. අවසාන වශයෙන් කොන්ත්‍රාත්තුව තීරණය වූ මුදල ,
VI. ව්‍යාපෘතිය කළ අයගේ නම හා ලිපිනය ,
VII. වැඩ පටන් ගත් දිනය,
VIII. වැඩ අවසන් කළ දිනය,
IX. ගෙවීම් කර අවසන් නම් එම දිනය ,

යන තොරතුරු ඇතුලත් වාර්තාවක් ඉදිරිපත් කරන්නේද?

(ඇ) මහජන නියෝජිත පාලනයක් නැති තත්වයක් තුල නගර සභාවේ ප්‍රතිපාදන යොදවා කරන ව්‍යාපෘති කවරේද යන්න තීරණය කරන්නේ කවුරුන්ද?

(ඈ) සංවර්ධනය නොකල එහෙත් සංවර්ධනය කළ යුතු මාර්ග ඇති බව ඔබතුමා දන්නේද?

(ඉ) ප්‍රමුඛතාවය අනුව හඳුනාගත් මාර්ග සංවර්ධනයට වැඩපිළිවෙලක් තිබේද?

(ඊ) ඉදිරියේ සංවර්ධනය කළයුතු මාර්ග පිළිබඳ ප්‍රමුඛතාවය අනුව නම් කළ හැකිද?

(උ) ඒ අනුව මාර්ග පිළිබඳව ලේඛනයක් ඉදිරිපත් කරන්නේද?

(ඌ) නොඑසේ නම් ඒ මන්ද?

6. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හ ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2017.06.20 දින අසන ලද ප්‍රශ්නය, (ප්‍ර/vi(1)/17/61)

---

(අ) 2015 සිට 2017 ජුනි 06 දක්වා මහරගම නගර සභාව විසින් කරන ලද මාර් සංවර්ධන ව්‍යාපෘති ගණන කීයද?

(ආ) එම සියලු මාර්ග සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධව,

I. ව්‍යාපෘතියේ නම ,
II. ප්‍රතිපාදන මූලාශ්‍රය,
III. ඇස්තමේන්තු මුදල,
IV. ව්‍යාපෘතිය ප්‍රදානය කළේ ටෙන්ඩර් මඟින්ද වෙනත් ක්‍රමයක් මඟින්ද යන
V. අවසාන වශයෙන් කොන්ත්‍රාත්තුව තීරණය වූ මුදල ,
VI. ව්‍යාපෘතිය කළ අයගේ නම හා ලිපිනය ,
VII. වැඩ පටන් ගත් දිනය,
VIII. වැඩ අවසන් කළ දිනය,
IX. ගෙවීම් කර අවසන් නම් එම දිනය,

යන තොරතුරු ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කරන්නේද?

(ඇ) මහජන නියෝජිත පාලනයක් නැති තත්වයක් තුල නගර සභාවේ ප්‍රතිපාදන යොද කරන ව්‍යාපෘති කවරේද යන්න තීරණය කරන්නේ කවුරුන්ද?

(ඈ) සංවර්ධනය නොකල එහෙත් සංවර්ධනය කළ යුතු මාර්ග ඇති බව ඔබතුමා දන්නේද?

(ඉ) ප්‍රමුඛතාවය අනුව හඳුනාගත් මාර්ග සංවර්ධනයට වැඩපිළිවෙලක් තිබේද?

(ඊ) ඉදිරියේ සංවර්ධනය කළයුතු මාර්ග පිළිබඳ ප්‍රමුඛතාවය අනුව නම් කළ හැකිද?

(උ) ඒ අනුව මාර්ග පිළිබඳව ලේඛනයක් ඉදිරිපත් කරන්නේද?

(ඌ) නොඑසේ නම් ඒ මන්ද?

7. ගරු මංජුල ප්‍රසන්න සම්පත් මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2017.06.20 දින අසන ලද ප්‍රශ්නය, (ප්‍ර/vi(1)/17/62)

---

අ) බස්නාහිර පළාතේ අඩු ආදායම්ලාභී පාසල් දරුවන් සඳහා නොමිලේ සපත්තු ලබාදීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කලේද?

ආ) ඒ සඳහා මුදල් ප්‍රතිපාදන කොපමණ වැය කළාද?

ඇ) එම මුදල් ලබා දුන්නේ පළාත් සභා අරමුදල් වලින්ද?

ඈ) සපත්තු මිළදී ගැනීමේදී සැපයුම්කරුවන් තෝරා ගත්තේ කෙසේද?

ඉ) ඒ සඳහා සැපයුම්කරුවන් කී දෙනෙකු ඉදිරිපත් වූවාද?

ඊ) සපත්තු ලබා දීමට තෝරාගත් ආයතනය කුමක්ද?

උ) සපත්තු මිළදී ගැනීම සඳහා පළාත් පාලන ආයතන අරමුදල් කොපමණ ලබා ගත්තේද?

ඌ) බස්නාහිර පළාතේ තෝරාගත් සිසුන්ට සපත්තු ලබා දී අවසන්ද?

එ) සපත්තු ලබා දීම සඳහා කොපමණ මුදලක් වැය කළාද?

ඒ) කැළණිය අධ්‍යාපන කලාපයේ අඩු ආදායම්ලාභී සිසුන් කී දෙනෙකුට සපත්තු ලබා දී ඇත්ද?

8. ගරු නන්දන පත්මකුමාර මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට; (ප්‍ර/vi(1)/17/63)

(අ)

I. කළුතර දිස්ත්‍රික්කයේ කළුතර අධ්‍යාපන කලාපයේ තිබෙන මුළු පාසැල් ප්‍රමාණය කොපමණද?
II. එය ජාතික පාසැල් ලෙස කොපමණද?
III. පළාත් පාසැල් ලෙස කොපමණද?

(ආ)

I. කළුතර කලාපයේ වර්ෂ 2016 අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටි මුළු දරුවන් සංඛ්‍යාව කොපමණද?
II. මෙම විභාගයට පෙනී සිටි ජාතික පාසැල්වල දරුවන් සංඛ්‍යාව කොපමණද?
III. මෙම විභාගයට පෙනී සිටි පළාත් පාසැල්වල දරුවන් සංඛ්‍යාව කොපමණද?

(ඇ)

I. ඉහත විභාගයට පෙනී සිටි මුළු දරුවන්ගෙන් සමත් හා අසමත් ප්‍රමාණය කොපමණද?
II. එය ජාතික පාසැල් මට්ටමින් සමත් හා අසමත් ප්‍රමාණය කොපමණද?
III. සමත් හා අසමත් සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව කොපමණද?
IV. මෙය පළාත් පාසැල් මට්ටමින් සමත් හා අසමත් ප්‍රමාණය කොපමණද?
V. සමත් හා අසමත් සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව කොපමණද?

9. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට; (ප්‍ර/vi(1)/17/64)

අ. පාසලකින් තවත් පාසලකට ස්ථානමාරු ලැබ යන ගුරුවරුන් සතුව පැවති පාසල සතු භාණ්ඩ නැවත භාරගෙන ලිපියක් නිකුත් කිරීම විදුහල්පති විසින් කළයුතු බව ඔබතුමා දන්නෙහිද?

ආ. එම ලිපිය නිකුත් කිරීමට විදුහල්පතිවරයෙකු විසින් උපරිම ලෙස ගතයුතු කාලයක් තිබේද? තිබේනම් කොපමණ කාලයක්ද?

ඇ. භාණ්ඩ භාරදීමේ ලිපිය නිකුත් නොකිරීම නිසා අදාළ සේවකයාගේ වැටුප් නැවැත්විය හැකි බව ඔබතුමා දන්නේද?

ඈ. කොලොන්නාව ශාන්ත ජෝශප් විදුහලේ විදුහල්පතිවරිය ආර්.පී.ඩී.කේ. ශ්‍රීමතී හා එල්.ඊ.එම්.එම්. සුමනරත්න යන ගුරු මහත්මීන්ට මෙම ලිපිය ලබා නොදීමෙන් අගතියක් සිදුවන බව පිළිගන්නේද?

ඉ. ජයවර්ධනපුර කලාප අධ්‍යාපන කාර්යාලය මඟින් ආර්.පී.ඩී.කේ. ශ්‍රීමතී මහත්මිය භාරදුන් භාණ්ඩ ලේඛනය සම්පූර්ණ බව පිළිගෙන තිබියදීත් විදුහල්පති මාස 05 ක් භාණ්ඩ භාරදීමේ එම ලිපිය ලබාදීම ප්‍රමාද කිරීම බලය අවභාවිතයේ යෙදීමක් නොවන්නේද? ඒ පිළිබඳව විනයානුකූලව කටයුතු කරන්නේද?

ඊ. එල්.ඊ.එම්.එම්. සුමනරත්න ගුරුවරියට පාසලෙන් වැටුප් නොගෙවීම, බැංකුවට වැටුප් නොගෙවන ලෙස දැනුම්දීම, ගිණුමෙන් වැටුප් මුදල ඉවත්කර ගැනීම මඟින් ද්වේශසහගතව හා අනීතිකව කටයුතු කිරීම සම්බන්ධව ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. සභාවේ කටයුතු

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට;

යෝජනාව :

2017.04.25 දින පළාත් සභා රැස්වීමේදී නිවේදනය කරන ලද, 2017.02.07 දින සභා සම්මත <u>"2017 අංක 01 දරණ බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරි ප්‍රඥප්තිය"</u> සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඌ (2) ව්‍යවස්ථාව යටතේ, එතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දන්වා එවනු ලැබූ, අංක **GOS/ADM/4/8/69** හා **2017.04.07** දිනැති ලිපියෙන් එවන ලද පණිවිඩයේ හා එහිම කොටසක් ලෙස සලකන ලෙසට දන්වා එවන ලද හා 2017.05.23 දින, මෙම පළාත් සභාවේදී නිවේදනය කල, සමාංක හා 2017.05.15 දිනැති පණිවිඩයේ සඳහන් සංශෝධනයන් ඉදිරිපත් කිරීමේ යෝග්‍යතාවය බස්නාහිර පළාතේ පළාත් සභාවේදී, නැවත සලකා බලන ලෙස දන්වා ඇති හෙයින් හා ඊට අනුගතව පිළිවෙලින් 2017.04.25 හා 2017.05.23 දිනවල පැවති මෙම පළාත් සභා රැස්වීම් හිදී නිවේදනය කළ හා එකඟතාවයන් පළ කල පරිදි 2017.05.19 දින පැවැති ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ අදහස් කෙරෙහිද සැලකිලිමත්ව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඌ (3) අනුව්‍යවස්ථාව යටතේ කටයුතු කිරීමට හැකිවන පරිදි හා 2017.06.21 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේදී එළඹුණු එකඟතාවයන්ට අනුව ක්‍රියා කිරීමට හැකිවන සේ අද දින න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයය යටතේ සඳහන් වැඩ කටයුතු සඳහා කාර්යය පටිපාටි රීති අංක 57(1), 57 (3) හා 57 (4) හි සඳහන් විධිවිධානයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතුය යැයි සලකා ක්‍රියා කිරීමට මෙම පළාත් සභාව එකඟ වෙයි.

## X. පොදු කටයුතු

01. ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා (බ.ප);

යෝජනාව :

'2017 අංක 01 දරණ බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය.

"2017.02.07 දින සභා සම්මත "2017 අංක 01 දරණ බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ඌ) 2 අනු ව්‍යවස්ථාව අනුව බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අංක GOS/ADM/4/8/69 දරණ 2017/04/07 දිනැති ලිපියෙන් එවන ලද පණිවිඩයේ හා එහිම කොටසක් ලෙසට සළකන ලෙසට දන්වා එවන ලද මෙන්ම 2017.05.23 දින මෙම පළාත් සභාවේදී නිවේදනය කළ සමාංක හා 2017.05.15 දිනැති පණිවිඩය කෙරෙහිද සැලකිල්ල ඇතිව, ප්‍රඥප්තිය නැවත සළකා බලා සංශෝධන සහිතව හෝ රහිතව එම ප්‍රඥප්තිය සම්මත කර ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමතය සඳහා , එතුමා වෙත ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි ක්‍රියාකළ යුතුය."

[2017.05.19 දින පැවැති ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ අදහස් ලැබී ඇත. ඇමුණුම - අංක 03]

| | | |
|---|---|---|
| අදාල ඇමුණුම් අංක 01 | - | ගරු ආණ්ඩුකාරතුමාගේ ලිපිය GOS/ADM/4/8/69 – 2017.04.07 දින |
| ඇමුණුම් අංක 02 | - | ගරු ආණ්ඩුකාරතුමාගේ ලිපිය GOS/ADM/4/8/69 – 2017.05.15 දින |
| ඇමුණුම් අංක 03 | - | ප්‍රඥප්ති හා නීති කාරක සභා වාර්තාව 2017.05.19 දින |
| ඇමුණුම් අංක 04 | - | 2017 අංක 01 දරන බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය - 2017.02.07 දින සභා සම්මත |
| ඇමුණුම් අංක 05 | - | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඌ (1), 154 ඌ (2), 154 ඌ (3) යන අනු ව්‍යවස්ථාවන් |

## XI. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

01. ගරු කිත්සිරි කහටපිටිය මන්ත්‍රීතුමා :

"ගෝලීයකරණය වූ ලෝකයක ඒකීය රටක් තුළ ජාත්‍යන්තර සබඳතා ඇතිකර ගනිමින් රට අනාගතය සුරක්ෂිත කර ගැනීමට අතිගරු ජනාධිපතිතුමාත් ගරු අග්‍රාමාත්‍යතුමාත් එක යහපාලන රජයක් බිහිකරමින් රටේ ජනතාව වෙනුවෙන් ඉටුකරණ මෙහෙවරට බස්නාහි පළාතේ පළාත් සභාව සිය ස්තුතිය පලකර සිටියි."

(යෝ/vi(1)/16/03)

2017.03.21 හා 2017.05.23 යන දිනවල පැවැති සභා රැස්වීම හි වැඩ කටයුතු හා සම්බන්ධිතයි.

02. ගරු පී.ඩී. අබේරත්න මන්ත්‍රීතුමා :

"කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත මැතිවරණ කොට්ඨාශයේ අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රත්මලේ ග්‍රාම නිළධාරි වසමේ පිහිටා ඇති තඹදොල ඇල්ල දෙස් විදෙස් සංචාරකයින් නිතර ගැවසෙන ඉතාමත් සුන්දර පරිසරයක් තිබෙන අලංකාර දිය ඇල්ලකි.

මෙම ස්ථානයේ සංචාරකයින්ට අවශ්‍ය පහසුකම් සලසමින් සංවර්ධනය කර බස්නාහිර පළාත් සංචාරක අමාත්‍යාංශය යටතේ පවත්වා ගෙන යා යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව, අදහස් කරයි."

(යෝ/vi(1)/16/04)

03. ගරු ලලිත් එල්ලාවල මන්ත්‍රීතුමා :

"බස්නාහිර පළාත තුළ පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන (පෙර පාසල්) වලට අමතර විධිමත් නොවන පරිදි පවත්වා ගෙන යනු ලබන පෙර පාසැල් විධිමත් කර ලියාපදිංචි කිරීම මෙ සම්බන්ධව විශේෂඥ දැනුම ඇති විධිමත් උපදේශක කමිටුවක් පත් කිරීමද, ලියාපදිංචි පෙර පාසල් ගුරු භවතුන්ට මාසිකව රු. 5000/- ක දීමනාවක් ගෙවීමට සුදුසු පියවර ගැනීම මැනවැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."

(යෝ/vi(1)/17/01

## XII. සභාව කල් තැබීම

කේ.එච්.ඩී.කේ. සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2017.06.21 දින.
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.